


ලක් ඉතිහාසයේ කලාකරුවකු විසින් වැඩිම රසික පිරිසකගේ සහභාගිත්වයෙන් පැවැත්වූ ප්‍රසංගයක් විය. ඒ 2003 ජුනි 01 දා කොළඹ ජෝන් ද සිල්වා සමරු රඟහලේ පැවැති එඩ්වඩ් ජයකොඩි ප්‍රතිභාවලෝකන සමරු ප්‍රසංගයයි. ශ්‍රී ලංකාවේ 5 වැනි විධායක ජනාධිපතිවරයා තෝරා ගැනීමේ උණුසුම් ඡන්ද සටනක්ද පවතින මොහොතක දේශපාලනඥයාගේ සමාජ මෙහෙවර පිළිබඳ කොතෙක් කතා කළද ශ්‍රී ලංකාවේ ඉහළ ජනප්‍රියත්වයක් හිමි විශාරද එඩ්වඩ් ජයකොඩි හමු වූයේ මැතිවරණයකදී කලාකරුවකුගේ සමාජ මෙහෙවර පිළිබඳව කතිකාවක යෙදෙන්නටය.

**සමාජයක් තුළ වෙසෙන සෑම පුරවැසියකු ගෙන්ම සමාජය යම් මෙහෙවරක් බලාපොරොත්තු වෙනවා. සංගීතඥයෙක් හැටියට ඔබගේ සමාජ මෙහෙවර මොකක්ද?**
මිනිස් සමාජය ගත්තොත් ඔවුන්ගේ අධ්‍යාපනික තත්ත්වය, වෘත්තීය මට්ටම, විවිධ හැකියාවන් අනුව විවිධ තලවලට බෙදන්න පුළුවන්. සැබෑ කලාකරුවාගේ සමාජ මෙහෙවර තමයි, ඔවුන් සිටිනා තලයෙන් තවත් ඉහළට ඔසවා තබන එක. කොටින්ම මිනිසාගේ ප්‍රඥාව දියුණු කරන එක තමයි කලාකරුවකුගේ සමාජ මෙහෙවර.

**මෙතෙක් ඔබ කළ නිර්මාණ තුළින් ඔය කියන සමාජ මෙහෙවර ඉටුවෙලා තියෙනවාද?**
තමා කළ නිර්මාණවලින් සෑහීමකට පත්වූ කිසි කලාකරුවකු මිහිපිට මෙතෙක් බිහි වී නැහැ. මමත් එහෙමයි. නමුත් මා මේ කෙටි කාලයක් තුළ කළ නිර්මාණ අතරින් සමාජයට අනර්ථයක් සිදු වූ එකඳු නිර්මාණයක්වත් නැහැ. ඒ ගැන මම සෑහීමකට පත්වෙනවා.



## දේශපාලකයා පාලනය කරන්න බැරිනම් කලාකරුවා දේශපාලනයේ නිරතවිය යුතු නැහැ

### විශාරද එඩ්වඩ් ජයකොඩි

**ඒ කියන්නේ නිර්මාණකරුවන් අතින් සමාජයට අනර්ථයක් සිදුවන නිර්මාණත් තියෙනවා?**
ඇයි නැත්තේ? දැන් වැඩිපුරම සංගීත ක්ෂේත්‍රය තුළ බිහි වන්නේ එවැනි නිර්මාණ තමා.

**එහෙමනම් ප්‍රවීණයෙක්, සංගීත විෂය පිළිබඳ උපාධි ධරයෙක්, අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙක් හැටියට එවැනි නිර්මාණ බිහිවීම වැළැක්වීමේ වගකීමකුත් ඔබට තියෙනවානේ?**
නිර්මාණ බිහිවීම කිසිවකුට වළක්වන්න බැහැ. එහෙම වළක්වන්න යාමෙන් ඇති ඵලයකුත් නැහැ. සිදුවිය යුත්තේ එවැනි නිර්මාණ සමාජගත වීම වැළැක්වීමයි. එහිදී දැඩි වගකීමක් මාධ්‍යයට තියෙනවා. අද අපේ රටේ බොහොමයක් විද්‍යුත් මාධ්‍ය මේ වගකීම පැහැර හැරලා.

**ඇයි ඔබ විද්‍යුත් මාධ්‍යයට දොස් කියන්නේ. මේවා පාලනය කරන්න රජයක් තියෙනවානේ?**
අන්න ඔතනදී තමයි අපි බුද්ධිමත් වෙන්න ඕනේ. සමාජයේ වුවමනා එපාකම් පැත්තකට දාලා දේශපාලකයින්ගේ වුවමනා එපාකම් මාධ්‍ය විසින් ඉටු කර දෙනකොට කොහොමද දේශපාලකයින් මේ මාධ්‍ය පාලනය කරන්නේ.

**මේ තත්ත්වය වෙනස් කරන්න නම් ඔබ මොකක්ද යෝජනා කරන්නේ?**
අපේ දේශීයත්වය, සංස්කෘතිය, සභ්‍යත්වය අගයන ජනතාවට හොඳ අවස්ථාවක් දැන් එළඹිලා තියෙනවා. ඒ ඉදිරි ජනාධිපතිවරණය. රටේ සාරධර්ම අගයන පුර-වැසියන්ට පුළුවන් එවැනි චින්තනයක් ඇති නායකයකු පත්කරගන්න.

**එහෙම චින්තනයක ඇති නායකයකු ඔබ තෝරාගෙනද ඉන්නේ?**
මෙවර ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙලා ඉන්න පක්ෂ නායකයන් 13 දෙනා ගැනම අපි හොඳ අධ්‍යයනයක් කර එක් අයකු තෝරාගෙන තියෙනවා.

**ඔහුගේ දැක්ක සුවිශේෂත්වය මොක-ක්ද?**
මෙහෙමයි. අපිට අපේ කියල රටක් තියෙන්න එපායැ. එතකොටනෙ අපේ අය තුළ අපේ දේවල් ප්‍රචලිත කරන්න පුළුවන්. කඳ බඩ ලංකාවේ තියල විදෙස් රටක පය ගහලා ඉන්න නායකයන්ට අපේ කම ගැන හැඟීමක් නැහැ. දේශීයත්වය කියන එක නැහැ. මඩසුවඳ තැවරුණු, දහඩිය සුවඳ විඳින්න පුළුවන්. ඒවා දැනෙන කෙනෙකුට අපේකම තියෙනවා. මමත් එවැනි පන්තියේ මිනිහෙක්.

**හොඳයි ඔබ ඔය කියන නායකයා රජ වුණා කියමු. ඔහුත් ඔබගේ මතයට පිටුපෑවොත් මොකද කරන්නේ. ගෝලීයකරණය තුළ අපිට හුදෙකලා වෙන්න බැහැනේ?**
හරි අන්න එදාටත් මම වගේම ජනතාව ඔහු ප්‍රතික්ෂේප කරන්න පසුබට වෙන්නේ නැහැ. ඒ වෙනුවෙන් අද වගේම එදාටත් අපට පෙනී සිටින්න වෙනවා. මොකද කලාකරුවකුට පුළුවන් දේශපාලකයාවත් පාලනය කරන්න. එහෙම බැරිනම් අප දේශපාලනයේ නිරත විය යුතු නැහැ.

**මේ ප්‍රකාශය පුවත්පතේ පළවෙනවා. ඔබ වගකීමකින් කියන්නේ.**
ඔව්? සියයට සියයක්ම.

**2003 ජූලි පළමු වෙනිදා ජෝන් ද සිල්වා රඟහලේ පැවැති ඔබගේ දීප්‍රතිභාවලෝකන ප්‍රසංගයට තමයි ලක් ඉතිහාසයේ මෙතෙක් කලාකරුවකු වෙනුවෙන් පැවැති ප්‍රසංගයකට වැඩිම රසික පිරිසක් රැස්වුණු ප්‍රසංගය ලෙස සැලකෙන්නේ. ඔබගේ දේශපාලන මතයත්, රසික මතයත් එකක් වෙයි කියලා හිතනවාද?**
මම සියයට සියයක්ම එහෙමයි කියන්නේ නැහැ. නිර්මාණවලට පක්ෂ භේද ජාති කුල මල නැහැ. ඒ වගේම තමයි රැස්වන රසික පිරිසත්. අපේ දේශපාලන දර්ශනය ඔවුන් පිළිගන්නේ ඔවුන්ට ඕනෑ විදියට.

**මේ තරම් රසික ප්‍රතිචාරයක් තියෙද්දී ඔබගේ ප්‍රසංගයකින් බැරිද ඔබට ස්වාධීන ගමනක් යන්න?**
එය දේශපාලනමය වශයෙන් නෙවෙයි. ඉන් බැහ-ැරව කතා කළ යුතු මාතෘකාවක්. මම මේ වසරේ ජූනි 18 දා කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී මාරම්බරී නමින් මගේ සංගීත ප්‍රසංගයක් පැවැත්වීමට කටයුතු සූදානම් කළා. සුනාමි රළ පහරත් එක්ක ඇතිවූ විනාශකාරී තත්ත්වය තුළ එය පවත්වන්න බැරි වුණා.

**සුනාමිය බණ්ඩාරනායක රඟහලට ආවේනැහැනේ?**
ඒක නම් ඇත්ත තමයි. ඒත් අපි ප්‍රසංගයක් පවත්වන්නේ අනුග්‍රාහකයන් හොයාගෙනනේ. රාජ්‍ය හෝ වේවා පෞද්ගලික හෝ වේවා එවැනි අනුග්‍රහයක් ඉල්ලන්න තරම් වාතාවරණයක් ඒ වන විට රට තුළ තිබුණේ නැහැ. එහෙම අනුග්‍රහයක් දක්වන්න කියන එකත් සාධාරණ නැහැ. ඒ නිසයි ඒ ප්‍රසංගය පැවැත්වූයේ නැත්තේ.




ලංකාවේ දී පුංචි තිරයත් සැබෑ ජීවිතයේ දී ළමා අධ්‍යාපනික හා විනෝදාත්මක වැඩ සටහන් ඉදිරිපත් කරමින් රසික හදවත් වලට සමීප වූ ශ්‍රීනාත් මද්දුමගේ නම් වන රංගන ශිල්පියා මෙල්බන් පුරවරයේ අලුත්ම වැඩකට සම්මාදම් වූ පුවත අපට අසන්නට ලැබුණා.


පුංචි දරුවනට සිංහල කතන්දර කියා දෙන ශ්‍රීනාත් මාමා

ලංකාවේ ස්වර්ණවාහිණියේ ස්වර්ණෝදය, රූපවාහිනියේ කතන්දර පිටුව, ටීඑන්එල් චැනලයේ කැලේ කඩේ, ස්වාධීන රූපවාහිනියේ සුදු පැංචා, සිරසේ යාලුයි අපි යාලුයි වැනි වැඩ සටහන් තුළින් වසර ගණනාවක් තිස්සේ පුංචි දරුවනට දැනුමත් විනෝදයත් ලබා දුන් ශ්‍රීනාත් ආචාර්ය රූඩි කොරෙන්ස් සමඟ පුංචි දරුවනට කතන්දර කීමේ වැඩ සටහනක් ද ක්‍රියාත්මක කළා. ඒ කොළඹ කෞතුකාගාරයෙ දී.

මත් පැන් හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානයේ වීඩියෝ වැඩ සටහන් අධ්‍යක්ෂවරයා වසර 12 ක් සේවය කළ ශ්‍රීනාත් තම හැකියාවන් තුළින් යහපත් සමාජයක් බිහිකිරීම උදෙසා විශාල සේවයක් කර තිබෙනවා. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ලේඛණ කලාව හා ජන සන්නිවේදනය පිළිබඳව හදාරා ඇති ශ්‍රීනාත් නාට්‍ය හා රූකඩ කලාව පිළිබඳව ජපානය, කොරියාව සහ ජර්මනිය වැනි රටවල වැඩ මුළු වලට සහභාගි ව තිබෙනවා. ඔහු ලංකාවේ බොහෝ පළාත් වල තරුණ තරුණියන්ට නාට්‍ය කලාව සහ මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව වැඩ මුළු පවත්වා තිබෙනවා.

තම සුවිශේෂ රංග කලා හැකියාවන් ගෙන් රසික හදවත් වලට සමීප වූ ශ්‍රීනාත් 1985 යෞවන සම්මාන උළෙලේදී විකල් සමය නාට්‍යය සඳහා හොඳම සහාය නළුවා සම්මානයෙනුත් 1993 දී කලිගුලා නාට්‍යය සඳහා විශිෂ්ඨ රංගන කුසලාන